## ULA AS 2014 – 06

# පුස්තකාලයේ දුර්ලභ අංශය භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්

**ඒ. ප්‍රදීපා උදයංගනී ද සිල්වා**
සහකාර පුස්තකාලයාධිපති, කැලණිය විශ්වවිද්‍යාලය
udayangani@kln.ac.lk & udayanganide@yahoo.co.in

කැලණිය විශ්වවිද්‍යාලයේ දුර්ලභ ග්‍රන්ථ අංශය දුර්ලභ ග්‍රන්ථ, විශේෂ එකතුව, ශ්‍රී ලංකා එකතුව හා පෞද්ගලික එකතූන්ගෙන් සමන්විත වේ. විමර්ශන අංශය, බැහැරදෙන අංශය, වාරසඟරා අංශය යන අංශයන් මෙන් පාඨකයන් අතර දුර්ලභ ග්‍රන්ථ අංශය එතරම් ජනප්‍රිය නොවූන ද දුර්ලභ ග්‍රන්ථ අංශය ද පාඨක භාවිතයේ අඩුවක් නොමැති බැව් පෙනී යන කරුණකි. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වී ඇත්තේ පුස්තකාලයේ දුර්ලභ ග්‍රන්ථ අංශයේ පාඨක භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම වේ. ප්‍රමාණාත්මක ගණයට අයත් පර්යේෂණයක් වන මෙය මූලිකවම පාඨක පැමිණීමේ සංඛ්‍යා ලේඛන මත පදනම්ව සිදු කරන ලදී. මෙහිදී 2013 වර්ෂය සඳහා උපාධි නිබන්ධන නිකුත් කිරීමේ ලේඛන හා පොත් නිකුත් කිරීමේ ලේඛනවල දත්ත භාවිතයට ගෙන අධ්‍යයනය සිදු කරන ලදී. එමෙන්ම දුර්ලභ ග්‍රන්ථ අංශයට පැමිණෙන සිසුන්ගෙන් අහඹු ලෙස තෝරා ගත් සිසුන් 50 ක් සමඟ සම්මුඛ සාකච්ඡා කොට අදහස් ලබා ගැනීම සිදු කරන ලදී. 2013 සංඛ්‍යා ලේඛන වාර්තාවන් වලට අනුව පාඨකයින් 5500 ක් දුර්ලභ ග්‍රන්ථ අංශයට පැමිණ ඇත. මෙය 2012 වර්ෂයේදී 2920 කි. උපාධි නිබන්ධන පරිහරණය දෙවන අර්ධ වාර්ෂිකයේ මුල් මාස කිහිපය තුළ ඉහළ ගොස් ඇති බව පාඨක සංඛ්‍යා ලේඛන අනුව පැහැදිලි වේ. 2013 වර්ෂය තුළ වැඩිම පාඨක සංඛ්‍යාවක් වාර්තා වනුයේ සැප්තැම්බර් මාසයේ වන අතර එය 595 කි. එමෙන්ම මෙහිදී අනාවරණය වූ තවත් කරුණක් වනුයේ සමාජීය විද්‍යා පීඨයේ සිසුන් වැඩි වශයෙන් (81%) උපාධි නිබන්ධන පරිශීලනයට යොමු වී ඇති බවය. මෙම අධ්‍යයනයේදී අනාවරණය වූ විශේෂ කරුණක් වනුයේ වාණිජ්‍ය හා කළමනාකරණ පීඨයේ සිසුන් කිසිවෙක් උපාධි නිබන්ධන විමර්ශණයට පැමිණ නැති බවයි. මානව ශාස්ත්‍ර පීඨය 7% (385) ද, විද්‍යා පීඨය 3% (165) ද, පශ්චාත් උපාධිධාරීන් 7% (385) ක් හා වෙනත් සිසුන් 2% (110) ක් වශයෙන් උපාධි නිබන්ධන පරිහරණය සඳහා පැමිණ ඇත. සංඛ්‍යා ලේඛන පරීක්ෂාවේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ කැපී පෙනෙන පාඨක වර්ධනයක් දුර්ලභ අංශය තුළ දැකිය හැකිය. 2012 වර්ෂයේ සමාජීය විද්‍යා පීය සිසුන් 2432 (83%) ක් ද, මානව ශාස්ත්‍ර පීය සිසුන් 164 (6%) ක් ද, විද්‍යාපීය සිසුන් 73 (2.5%) ක්ද, පශ්චාත් උපාධි පීය සිසුන් 184 (6%) ක් දුර්ලභ ග්‍රන්ථ අංශයට පැමිණ ඇති බව දක්නට ලැබේ. බැහැරදෙන අංශයේ මෙන් දුර්ලභ ග්‍රන්ථ අංශයේ පොත් බැහැරට නිකුත් කිරීමක් සිදු නොවන අතර විමර්ශණය සඳහා පමණක් පොත් නිකුත් කරනු ලැබේ. 2013 වර්ෂයට අදාළව පාඨකයන් 460 ක් පොත් ලබා ගැනීමට පැමිණ ඇති අතර ඔවුන්ගේ පොත් භාවිතය 595 කි. පොත් පරිහරණය කරන සිසුන් අතර වැඩි පිරිසක් (91%) සිටිනුයේ සමාජීය විද්‍යා පීඨයේ හා මානව ශාස්ත්‍ර පීඨයේය. පශ්චාත් උපාධි අපේක්ෂකයන් 8% (37) ක් පැමිණෙන අතර වාණිජ්‍ය හා කළමනාකරණ පීඨයේ සිසුන් 1% (5) ක් පැමිණීම වාර්තා වේ. 2013 වර්ෂයට පූර්ව දුර්ලභ ග්‍රන්ථ අංශයේ පාඨක පැමිණීම අඩු වූ අතර වර්තමානය වන විට සිසුන්ගේ පැමිණීමේ වර්ධනයක් දැකිය හැකිය. දුර්ලභ ග්‍රන්ථ අංශය නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම, වැඩි ඉඩකඩක් විමර්ශනය සඳහා ලබා දී තිබීම, පාඨක මිත්‍රශීලි පරිසරයක් නිර්මාණය කර තිබීම, විධිමත්ව එකතුව පවත්වා ගෙන යාම, විවෘත රාක්ක ක්‍රමයට යොමු වීම පාඨක පැමිණීම වර්ධනයට බලපා ඇති කරුණු කිහිපයක් ලෙස පෙන්වා දිය හැකිය. දුර්ලභ ග්‍රන්ථ අංශයේ පාඨක පරිහරණය සඳහා තව දුරටත් ඉඩකඩ පුළුල් කිරීම, විවිධ විෂයයන් යටතේ උපාධි නිබන්ධන එකතුවට එක් කිරීම, පාඨක පරිහරණයට පරිගණක තව දුරටත් ස්ථාපිත කිරීම තුළින් පාඨක භාවිතය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබී ඇත.

මූල පද: දුර්ලභ ග්‍රන්ථ භාවිතය, කැලණිය විශ්වවිද්‍යාලය, පාඨක තෘප්තිමත්භාවය